**ලුණුගල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 27 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ලුණුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ස්ථාවර වත්කම් හා දේපල ක්ෂය කිරීම ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා තොග ගණනය කිරීම හා මිල කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාවේ ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ වටිනාකම එකිනෙක සමාන විය යුතු වුවද එම ශේෂයන්ගේ රු.906,406 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත්වල ලෙජරය අනුව නිවැරදි වටිනාකම රු.925,869 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුනේ රු.1,763,144 කි. ඒ අනුව පුස්තකාල පොත් ගිණුමේ ශේෂය රු.837,275 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ කුලී මුදල් ආදායම රු.3,942,329 ක් වුවත්, ලෙජරය අනුව නිවැරදි ශේෂය රු.3,486,366 ක් වූයෙන් කුලී මුදල් ආදායම රු.455,963 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම රු.1,344,680 ක් වුවත්, ලෙජරය අනුව නිවැරදි ශේෂය රු.1,721,741 කු වූයෙන් රු.377,061 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමේ දී රු.4,910,842 ක් වටිනා ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබුණු රු.61,500 ක මන්ත්‍රී දීමනා හා රු.1,704,753 ක උසාවි දඩ සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබුණ රු.876,266 ක උසාවි දඩ ගිණුම් ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 17 දින සභාවට ලබාදුන් රු.2,161,900 ක් වූ ට්‍රැක්ටර් රථයේ වටිනාකම ස්ථාවර වත්කම් වල දක්වා නොතිබුණි.

(එ) ඉකුත් වර්ෂයට අදාලව ලැබුණු රු.158,595 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයට ගිණුම්ගත කර තිබුණි.

1.3.4 **නොසැසඳූ පාලන ගිණුම්**

--------------------------

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් ඊට අදාල ලෙජර් ගිණුම් සමඟ සැසඳීමේ දී රු.1,126,696 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.5 අවිනිශ්චිත ගිණුම

රු.678,671 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

### 1.3.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 25,942,641 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.17,778,649 ක් විය.

### 1.3.7 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු. 15,071,193 ක් වටිනා ගිණුම් විෂයයන් 05 ක් අදාල විගණන සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.8 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1980 අංක 47 පරිසර පනත හා 2000 නොවැම්බර් 22 දින අංක 1159/22 දරන ගැසට් නිවේදනය | සභා බල ප්‍රදේශයේ ව්‍යාපාර/කර්මාන්ත 23 ක් සම්බන්ධයෙන් පරිසර බලපත්‍ර ලබාදී නොතිබුණි |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 | තැන්පත් කළ දින සිට වර්ෂ දෙකක් තුල හිමිකම් නොපෑ වටිනාකම රු.90,333 ක් වූ තැන්පත් 20 ක් නියාදනය කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.746,535 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත්

වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,924,972 ක් වූයෙන් මූලා ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම රු.1,178,437 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

---------------------

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

**හිඟ ආදායම් අයකිරීම**

------------------------

2014 ජනවාරි 01 දිනට පැවැති අක්කර බදු හිඟයෙන් 18% ක මුදලක් 2014 වර්ෂයේ අයකර ඇති අතර, ගෙවල් කුලී, වරිපනම් වලින් පිළිවෙලින් 9.6% ක් හා 21.8% ක් පමණක් අයකර ගෙන තිබූණෙන් හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය අසතුටුදායක තත්ත්වයක පැවතින.

### 2.2.2 වරිපනම් බදු

--------------

වර්ෂ 05 කට වරක් වරිපනම් බදු සංශෝධනයක් සිදුකර ඒ අනුව වරිපනම් බදු අයකළ යුතු වුවද, 2014 වර්ෂය සඳහා 2005 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකරමින් පැවැතුනි.

### 2.2.3 දේපොල බදු

--------------

සභාව සතු බදු දේපොල 08 ක් 2011 වර්ෂයේ සිට 2014 දක්වා වර්ෂ 04 ක් වාර්ෂිකව බදුදීම වෙනුවෙන් රු.1,271,523 ක මුදලක් 2014 දෙසැම්බර් 31 දක්වාත් සභාව විසින් අයකරගෙන නොතිබුණි.

### 2.2.4 කඩ කුලී

----------

1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව පළාත් පාලන ආයතන සතු වෙළඳපොල කඩ කාමර අවම වශයෙන් වසර පහකට වරක්වත් තක්සේරු කර කඩ කුලී අයකළ යුතු වුවත්, සභාව විසින් මඩොල්සිම නගරයේ කඩ කාමර 28 සඳහා 2005 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන බදු කුලී අයකෙරෙමින් පැවතුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

(අ) ඌව පළාත් සභා අරමුදල් යටතේ සභාව විසින් 2014 අගෝස්තු මාසයේ දී සිමෙන්ති මළු 30 ක් සඳහා රු.27,900 ක මුදලක් පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණ ද 2015 ජුනි 26 විගණන දිනය වන විටත් අදාල කෝවිලට සිමෙන්ති ලබාදී නොතිබුණි.

(ආ) සභාවට අයත් පුස්තකාලයේ රු.29,066 ක් වටිනා පොත් 172 ක ප්‍රමාණයක් පුස්තකාලයේ නොතිබූ අතර එම පොත් ආපසු ලබාගැනීමට හෝ ඒ සඳහා මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 **නිෂ්ක්‍රිය වත්කම්**

-----------------

සභාව සතු අංක 78-9579 දරන අත්ට්‍රැක්ටර් රථය භාවිතයකින් තොරව සභා භූමියේ නිෂ්කාර්යව දිරාපත්වෙමින් පැවතුනි.

4. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය